සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

41866

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

11 S I

දෙවන වාර පරීක්ෂණය, 2018 ජුලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

බුද්ධ ධර්මය - I
Buddhism - I

පැය එකයි
One hour

විභාග අංකය ..........................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

1. සිදුහත් කුමරුගේ ගුරුවරයා වූයේ,
   1. ආළාර කාලාම තවුසා
   2. උද්දකරාම පුත්ත තවුසා
   3. සර්වමිත්‍ර බමුණා
   4. අසිත තවුසා

2. තේජසින් සපිරි ශාන්ත වූ ප්‍රියංකර වූ අනුපමේය රූපශ්‍රීය දක බෝසතාණන් වහන්සේට නිබ්බුත පද කීවේ,
   1. සුජාතා සිටු දේවියයි.
   2. යශෝදරා දේවියයි.
   3. කිසා ගෝතමීයයි
   4. මහා ප්‍රජාපතී ගෝතමීයයි.

3. සංසාරගත දුකින් මිදී නිවන් පසක් කර ගනු පිණිස මිනිසාට මග පෙන්වනු ලබන්නේ,
   1. වැඩිහිටියන් ය.
   2. මහා සංඝරත්නයයි.
   3. ගුරුවරුන් ය.
   4. දෙමාපියන් ය.

4. පිංකම් කිරීම තුළින් බෞද්ධයා බලාපොරොත්තු විය යුත්තේ,
   1. ලෝභ ද්වේශ, මෝහ යන අකුසල් මුල් ක්‍රමයෙන් තුනී කරගැනීමය.
   2. කීර්තිනාමය ලබා ගැනීමය.
   3. විහාරස්ථානයේ දියුණුව ඇතිකර ගැනීමය.
   4. ලෝභය ක්‍රමයෙන් නැති කරගැනීමය.

5. භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගෙන් ප්‍රත්‍ය පහසුකම් අතිශයින් කාරුණික ලෙස ලබා ගත යුතු යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ,
   1. වේයා තුඹස බඳින්නා සේය.
   2. මී මැස්සා වදයක් බඳින්නා සේය.
   3. බඹරා මල නොතලා රොන් ගන්නා සේය.
   4. දෙබරා වදයක් බඳින්නා සේය.

6. තෙරුවන් ගුණ සංඛ්‍යාව,
   1. නවයකි
   2. හයකි.
   3. දොළහකි.
   4. විසිහතරකි.

7. රහසත් පව් නොකොට............... යන පද්‍ය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
   1. ලෝවැඩ සඟරාව යි.
   2. බුදුගුණ අලංකාරය යි.
   3. සුභාෂිතය යි.
   4. ලෝකෝපකාරය යි.

8. නිවන් පසක් කර ගැනීමට අවශ්‍ය වූ මනා වූ පිළිවෙත් රකින බැවින් මහා සංඝරත්නය,

1. සුපටිපන්න නම් වේ.
2. උජුපටිපන්න නම් වේ.
3. සාමීචි පටිපන්න නම් වේ.
4. ආහුණෙය්‍ය නම් වේ.

9. බුදු දහමේ පංච නීවරණ ධර්ම උපමා මගින් දක්වා ඇත. එහිදී උතුරණ ජලයට උපමා කර ඇත්තේ,

1. විචිකිච්ඡාව යි.
2. කාමච්ඡන්දය යි.
3. ව්‍යාපාදය යි.
4. ථිනමිද්ධය යි.

10. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීලයට අයත් අංග වන්නේ,

1. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා
2. සම්මා වාචා, සම්මා සති, සම්මා සමාධි
3. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
4. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

11. සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමු වීමේදී ඒ පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංගයකි, සති සම්පජඤ්ඤ, මෙහි සති සම්පජඤ්ඤ යනු,

1. හිඳීම, සිටීම, ඇවිදීම ආදී ක්‍රියාවන්හි දී අවබෝධයෙන් යුතු වීමයි.
2. ලද දෙයින් සතුටු වීමයි.
3. ඇස කන නාසය ආදී ඉන්ද්‍රියන් සංවර කර ගැනීමයි.
4. පහසුවෙන් පෝෂණය කළ හැකි බවයි.

12. අ. අටලෝ දහමින් කම්පා නොවෙයි.
ආ. සිත විසිරී යාමට නොදී සිත එකඟ වේ.
ඇ. කායික රෝග පීඩා අඩු වී නිරෝගී වේ.
ඉ. ධාරණ ශක්තිය වැඩි වේ. යන ප්‍රයෝජන අතර සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන වන්නේ,

1. අ ආ ඇ
2. අ ඇ ඉ
3. ආ ඇ ඉ
4. අ ආ ඉ

13. අපගේ සාමාන්‍ය සම්මුති තුවණ ඉක්මවා ඇත්ත ඇති සැටියෙන් දැකීම නම් වූ පරමාර්ථ සත්‍යාවබෝධය ඇති කර ගැනීමට වැඩිය යුත්තේ,

1. සමථ භාවනාව යි.
2. විපස්සනා භාවනාව යි.
3. පිළිකුල් භාවනාව යි.
4. මෛත්‍රී භාවනාව යි.

14. "සිල්වත් සමාගම" නමින් සංවිධානයක් පිහිටුවාගෙන බුදු සසුන නගා සිටුවීම සඳහා කටයුතු කළේ,

1. රේරුකානේ චන්දවිමල හිමි.
2. වාරියපොළ සුමංගල හිමි
3. වැලිවිට සරණංකර හිමි
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

15. මිරිසවැටිය නම් වූ චෛත්‍යය කරවූයේ,

1. දෙවන පැතිස් රජතුමා ය.
2. නිශ්ශංක මල්ල රජතුමා ය.
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.
4. දුටුගැමුණු රජතුමා ය.

16. "දුශ්ශීලව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සියයක් ජීවත්වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨය" යන අදහස දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,

1. යෝචේ වස්ස සතං ජීවේ.....
2. යෝච පුබ්බේ පමජ්ජිත්වා.....
3. අචරිත්වා බ්‍රහ්මචරියං.....
4. උට්ඨානවතෝ සතිමතෝ....

7. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණයට අයත් නොවන්නේ,

1. මහත් වූ භෝග සම්පත් අත්පත් කරගැනීම
2. කීර්තිය පැතිරීම
3. සිහි මුලා වී කළුරිය කිරීම
4. සුගතියක උපත ලැබීම.

8. භෝග විනාශයට හේතුවන කරුණු හයක් පිළිබඳ සඳහන් වන්නේ,

1. පරාභව සූත්‍රයේ
2. සිගාලෝවාද සූත්‍රයේ
3. පත්තකම්ම සූත්‍රයේ
4. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ

9. සිල් රැකීම හේතුවෙන් මෙලොව දී ලැබෙන ආනිසංස ගණන වන්නේ,

1. 4කි.
2. 5කි.
3. 11කි.
4. 10කි.

0. සිගාලෝවාද සූත්‍රයට අනුව හිතමිතුරන් දක්වා ඇති දිශාව වන්නේ,

1. නැගෙනහිර
2. බටහිර
3. උතුර
4. දකුණ

1. අ. ගරු කිරීම.

ආ. ගෙදර වගකීම් පැවරීම.

ඇ. උපයන ලද ධනය ආරක්ෂා කිරීම.

ඉ. පරදාර සේවනයේ නොයෙදීම යන යුතුකම් අතර ස්වාමිපුරුෂයා ඉටුකළ යුතු යුතුකම් වන්නේ,

1. අ ආ ඇ
2. ආ ඇ ඉ
3. අ ඇ ඉ
4. අ ආ ඉ

2. පවින් වැළැක්වීම, යහපත් ක්‍රියාවල යෙදවීම, නොඇසූ දේ කියා දීම යන යුතුකම් ඉටු කරන්නේ,

1. ගුරුවරු ශිෂ්‍යයන්ට
2. දෙමාපියන් දූ දරුවන්ට
3. ගිහියා පැවිදි පක්ෂයට
4. පැවිදි පක්‍ෂය ගිහියාට

3. මාතා පිතා දිසා පුබ්බා........ යන ගාථාව ඇතුළත් වන්නේ,

1. සිගාලෝවාද සූත්‍රයේ ය.
2. ධම්මපදයේ ය.
3. මහා මංගල සූත්‍රයේ ය.
4. කරණීය මෙත්ත සූත්‍රයේ ය.

4. පැවිදි පක්ෂය ගිහියන්ට ඉටුකළ යුතු යුතුකම් ගණන,

1. 5කි.
2. 6කි.
3. 10කි.
4. 4කි.

5. ඔබ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක් දැයි පිළිවෙළින් බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

1. ද්‍රෝණ බමුණා ය.
2. උපතිස්ස පිරිවැජියා ය.
3. නිගන්ඨනාථපුත්ත ශාස්තෘවරයා ය.
4. උපක ආජීවක තුමා ය.

6. ප්‍රසන්න දුසිරිත් කරන මිනිසුන් අතර සුසිරිත් වඩයි. අකුසල් කරන මිනිසුන් අතර කුසල් කරයි. ඔහු ,

1. අනුසෝතගාමීව කටයුතු කරයි.
2. පටිසෝත ගාමීව කටයුතු කරයි.
3. සිල්වත්ව කටයුතු කරයි.
4. අහිංසකව කටයුතු කරයි.

"මගේ ජීවිතයට කිසිවෙක් හානිකරනවාට මම අකමැතියි. එනිසා මම කිසිවකුගේ ජීවිතයකට හානියක් නොකරමි. එනම් කිසිම සතෙක් නොමරමි." යනුවෙන් අරවින්ද බෞද්ධ සමිතියේ දී අදහස් දැක්වීය. ඔහු අනුගමනය කරන්නේ,

1. මධ්‍යම ප්‍රතිපදාවයි.
2. සල්ලේඛ ප්‍රතිපදාවයි.
3. ත්‍රිකෝටි පාරිශුද්ධියයි.
4. අත්තුපනායික ධර්ම පර්යායය යි.

28. අනුන්ගේ දියුණුවට උදව් කිරීම බුදු දහමේ දක්වන්නේ,
1. පරාර්ථකාමී බව යනුවෙනි.
2. අර්ථචර්යාව නමිනි.
3. පරහිතකාමී බව යනුවෙනි.
4. සමානාත්මතාව යනුවෙනි.

29. සාමානාත්මතාවයෙන් සංග්‍රහ කරමින් ජාතික ආගමික සමගිය සහජීවනය ගොඩ නගා ගැනීමට මග පෙන්වන්නේ,
1. සිවු සඟරාවතයි.
2. සතර බ්‍රහ්ම විහරණ යි.
3. පංච බලි ය.
4. පංච ශීල ප්‍රතිපත්තියයි.

30. දස අකුසල් අතර මනෝ කර්ම ගණයට අයත් නොවන්නේ,
1. අභිද්‍යාව යි.
2. ව්‍යාපාදය යි.
3. මිථ්‍යාදෘෂ්ටිය යි.
4. සම්පප්පලාපය යි.

31. දස අකුසල් අතර කාය කම්ම ගණයට අයත් වන්නේ,
1. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය
2. අභිද්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යා දෘෂ්ටිය
3. පිසුනාවාචා, පරුෂාවාචා, සම්පප්පලාප
4. ප්‍රාණඝාතය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය

32. කොසොල් රජුගේ බිසවක වූ මල්ලිකාව අවසන් මොහොතෙහි සිතට නැගුණු අකුසල සිතුවිල්ලක් නිසා දුගතිගාමී විය. ඊට අදාළ කර්මය වන්නේ,
1. ආසන්න කර්මයයි.
2. ආචිණ්ණ කර්මයයි.
3. කටත්තා කර්මයයි.
4. ජනක කර්මයයි.

33. මිය පරලොව ගොස් ඊලඟ භවයක උපත ලබා දීමට ඉවහල් වන කර්මය වන්නේ,
1. ජනක කර්මයයි.
2. උපත්ථම්භක කර්මයයි.
3. උපපීළක කර්මයයි.
4. උපඝාතක කර්මයයි.

34. සුනීතා දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදා විය. එසේ වූයේ,
1. ගති සම්පත්ති හේතුවෙනි.
2. උපධි සම්පත්ති හේතුවෙනි.
3. කාල සම්පත්ති හේතුවෙනි.
4. පයෝග සම්පත්ති හේතුවෙනි.

35. බුදු දහමට අනුව පංචස්කන්ධය උපමාවලින් දක්වා ඇත. එහිදී මිරිඟුවකට උපමා කර ඇත්තේ,
1. රූපයයි.
2. වේදනාවයි.
3. සඤ්ඤාවයි
4. විඤ්ඤාණයයි.

36. "ඔබ වහන්සේ පැවිදි වූයේ කවරකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක්ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ? යනුවෙන් ඇසුවේ."
1. උපක ආජීවකතුමා බුදුරජාණන් වහන්සේගෙනි.
2. උපතිස්ස පිරිවැජි තුමා අස්සජි රහතන් වහන්සේගෙනි.
3. කෝලිත පිරිවැජිතුමා අස්සජි රහතන් වහන්සේගෙනි.
4. උරුවෙල් කාශ්‍යප බුදුරජාණන් වහන්සේගෙනි.

37. පරලොවක් නැත යන පිළිගැනීම අනුව, මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව හඳුන්වන්නේ,
1. කාම තණ්හාවයි
2. භව තණ්හාවයි
3. විභව තණ්හාවයි
4. ත්‍රිවිධ තණ්හාවයි.

38. බුදුරජාණන් වහන්සේට උතුම් බුදුබව ලබා දීමට උපකාරී වූ ඇසතු බෝධි වෘක්ෂය දෙස සතියක් ඇසිපිය නොහෙලා බලා සිටිමින් කෘතවේදීත්වය දක්වූහ. එය සිදුවූයේ, සත් සතිය ගත කළ කාලය තුළ කුමන සතියේද?

1. පළමු සතියේ ය.
2. තෙවන සතියේ ය.
3. දෙවන සතියේ ය.
4. පස්වන සතියේ ය.

39. බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යය වනයෙහි වැඩ වෙසෙමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලැබුවේ.

1. දහවන වස්කාලයේ ය.
2. අටවන වස්කාලයේ ය.
3. පස්වන වස්කාලයේ ය.
4. දෙවන වස් කාලයේ ය.

40. අකුසලය ද අකුසල විපාකය ද කුසලය ද කුසල විපාකය ද දැන දැක ගන්නා ඥානය වන්නේ,

1. සත්‍ය ඥානයයි.
2. සම්මා දිට්ඨියයි.
3. කෘත්‍ය ඥානයයි.
4. සුතමය ඥානයයි.

(ල. 1 x 40 - 40)

42432

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

11 S II

දෙවන වාර පරීක්ෂණය, 2018 ජුලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

බුද්ධ ධර්මය - II
Buddhism - II

පැය දෙකයි
Two hours

විභාග අංකය ..........................................

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද, ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු වැනි ප්‍රශ්නයට ලකුණු 20ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) 1. පංච මහා විලෝකනවලින් 4ක් නම් කරන්න.
2. ශ්‍රද්ධාව යනු කුමක්ද?
3. "චිත්තං සමේතීති සමථො" යන්නෙහි අදහස ලියන්න.
4. භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
5. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
6. "සමග්ගා හෝථ මා විවදථ" යන්නෙහි අදහස ලියන්න.
7. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය." යන ප්‍රකාශය කළේ කවුරුන්ද?
8. "හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති" යන්නෙහි අදහස ලියන්න.
9. පටිච්ච සමුප්පාදයේ මූල සූත්‍රය ලියන්න.
10. සතර සතිපට්ඨානය නම් කරන්න. (ලකුණු - 20)

02) 1. සිදුහත් කුමරාට මුහුණ දීමට සිදු වූ අභියෝගවලින් 2ක් නම් කරන්න. (ල.02)
2. සිදුහත් කුමරුට අභියෝග සියල්ල ජයගැනීම සඳහා කුමරුගේ චරිතයේ පැවති ගුණාංග 3ක් නම් කරන්න. (ල.03)
3. ඔබට ශිෂ්‍ය ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන අභියෝග ජයගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල.05)

(03) 1. සීලය යනු කුමක්ද? (ල.02)
2. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංසවලින් 3ක් නම් කරන්න. (ල.03)
3. සිල්වත් වීම පුද්ගල සංවර්ධනයට හේතුවන අයුරු පැහැදිලි කරන්න. (ල.05)

(04) 1. උට්ඨානවතෝ සතිමතෝ....... ගාථාව සම්පූර්ණ කරන්න. (ල.02)
2. එහි අදහස ලියන්න. (ල.03)
3. එම ගාථාවේ සඳහන් කරුණු ඇසුරින් ඔබේ ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු පහදන්න. (ල.05)

(05) 1. සිගාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර හා දකුණු දිශාවෙන් හැඳින්වෙන සමාජ කණ්ඩායම් දෙක පිළිවෙලින් නම් කරන්න. (ල.02)
2. සිගාලෝවාද සූත්‍රයට අනුව ශිෂ්‍යාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් 3ක් නම් කරන්න. (ල.03)
3. "අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීම සමාජයේ දියුණුවට හේතු වේ." අදහස් දක්වන්න (ල.05)

(06) 1. කර්මය යනු කුමක්ද? (ල.02)
2. කර්මය තුන් ආකාර වේ. ඒවා මොනවාද? (ල.03)
3. අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් දෙලොව ජීවිත සාර්ථක කරගත හැකි අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
1. දුටුගැමුණු රජතුමා
2. සමථ භාවනාව
3. චතුරාර්ය සත්‍ය
4. දිට්ඨධම්ම වේදනීය කර්ම

(ල.5 x 2)